සමිර හේරත්

**නිසැක ජය අත්වැල**

ප්‍රශ්ණ පත්‍ර අංක - 01

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යනය**

**කාලය පැය 2 යි.**

**1.** සමාජය යනු සන්නිවේදනය මගින් පවත්වාගෙන යනු ලබන සබඳතා ජාලයකි මෙම අදහස ඉදිරිපත් කළේ

(1) විල්බර් ශ්‍රාම් (2) එඩ්වඩ් සැපීර් (3) හැරල්ඩ් ඩී. ලැස්වෙල්

(4)චාල්ස් ඔස්ගුඩ් (5) චාල්ස් කූලී ය.

**2.** සන්නිවේදන ක්‍රියාවලිය පවත්වාගෙන යාම සඳහා ප්‍රධාන වශයෙන් අවශ්‍ය වන්නේ,

(1) සන්නිවේදකයා (2) ග්‍රාහකයා (3) බලපෑම
(4) පණිවිඩය (5) නාලිකාව

**3.** පැරණි මුද්‍රණ ශිලිපයේ හා නූතන මුද්‍රණ ශිලිපයේ ආරම්භක රටවල් ලෙස සැලකෙන්නේ,

(1) එංගලන්තය සහ ජර්මනිය (2) ග්‍රීසිය සහ රෝමය
(3) ඉන්දියාව සහ ඇමරිකාව (4) චීනය සහ ජර්මනිය
(5) මිසරය හා ජර්මනිය

**4.** සන්නිවේදන වර්ගීකරණය සඳහා මූලිකව යොදාගන්නා සාධකයක් වන්නේ,

(1) අවස්ථාවයි (2) පුද්ගල චර්යාවයි
(3) සහභාගී වනසංඛ්‍යාවයි (4) නාලිකාවයි
(5) සන්නිවේදන කුසලතාවයි

**5.**පහත සඳහන් ඒවා අතුරින් යම් උපදේශයක් මතයක් හෝ අදහසක් ඉතා සංක්ෂිප්තව හා ප්‍රබල ලෙස ප්‍රකාශ කිරීමේ හැකියාව ඇත්තේ කුමකටද?

(1) ජාතක කථා (2) ජන ගී (3) ප්‍රස්ථාව පිරුළු
(4) තේරවිලි (5) ජන කවි

**6.** ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ බොහෝ දොරටුපාලකයෝ **සිටිති.** ඔවුන් විසින් මූලිකවම සිදු කරනු ලබන්නේ,

(1) පණිවිඩ ගලා යාම පාලනය කිරීම ය
(2) අහිතකර බලපෑමක් සිදු කිරීම
(3) තොරතුරු සත්‍ය ලෙස ඉදිරිපත් කිරීම
(4) පාලකයාට අභිමත ලෙස ක්‍රියා කිරීම
(5) මූල්‍යම ප්‍රතිලාභ ලබා ගැනීම

**7.** ජනමාධ්‍ය සංකල්ප පිළිබඳ අවධානය යොමු කිරීමේදී බුද්ධමය දේපල පනත සහ ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත අධාල වන්නේ,

(1) අධිපතිවාදී සංකල්පයේ දී ය (2) නිදහස් මතවාදී සංකල්පයේ දී ය
(3) ප්‍රජාතන්ත්‍රීකරණ සංකල්පයේ දී ය (4) සංවර්ධන සංකල්පයේ දී ය
(5) සමාජ වගකීම් සංකල්පයේ දී ය

**8.** රූපවාහිනියෙහි විකාශනය වන රාත්‍රී ප්‍රවෘත්ති නැරඹීම සඳහා සූදානම් වූ විශ්වට, රූපවාහිනියේ අපැහැදිලි රූප නිසා රටෙහි උද්ගතව පැවති ගංවතුර පිළිබඳ නිසි අවබෝධයක් ලබා ගැනීමට නොහැකි විය. මෙය සන්නිවේදන න්‍යායාත්මකව හඳුන්වනු ලබන්නේ,

(1) රූපවාහිනියෙහි කාර්මික දෝශයක් ලෙසට ය
(2) අවට පරිසරයේ ගැටළුවක් ලෙසට ය
(3) මාධ්‍ය භාධාවක් ලෙසට ය
(4) ඇන්ටනාවෙහි දෝෂයක් ලෙසට ය
(5) පුද්ගල විභින්නතා න්‍යාය ලෙසට ය

**9.** අමල් පාසලේදී කිය වූ පොතක් ගැන සිහිකරමින් බසයට නගින විට බසය මගීන්ගෙන් පිරී තිබුණි. මෙහි දක්නට ලැබෙන සන්නිවේදන වර්ගය වන්නේ,

(1) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
(2) සමූහ සන්නිවේදනය
(3) අන්තර් පුද්ගල සන්නිවේදනය
(4) ජන සන්නිවේදනය
(5) දෘෂ්‍ය සන්නිවේදනය

**10.** තොරතුරු ඉහළ සිට පහළට ගලාගෙන ඒමේ සම්ප්‍රධාය මගින් ඉදිරිපත් කරනු ලබන සංදේශ පිළිබඳ ප්‍රශ්ණ කිරීම් නොමැත. මෙම ලක්ෂණ අයත් සන්නිවේදන සංකල්පය වන්නේ,

(1) සෝවියට් කොමියුනිට්ස් සන්නිවේදන සංකල්පය
(2) නිදහස් මතවාදී සන්නිවේදන
(3) සංකල්පය අධිපතිවාදී සන්නිවේදන සංකල්පය
(4) සංවර්ධන සන්නිවේදන
(5) සංකල්පය ප්‍රජාතන්ත්‍රීකරණ සන්නිවේදන සංකල්පය

**11.** පාථමික යුගයේ මානවයා තම සන්නිවේදන අවශ්‍යතා සඳහා යොදා ගත් ක්‍රම විධි සඳහා අයත් **නොවන්නේ**

(1) අව්ධිමත් කටහඬ, හූ හඬ, විවිධ වර්ණ
(2) සංඥා, අභින, විවිධ හඬ
(3) සත්ව ඇටකටු, මුහුණේ ඉරියව්, විවිධ වර්ණ
(4) තල්පත්, සත්ව හම්, ගල් බිත්ති
(5) දුම, හූ හඬ, විවිධ නලා වර්ග

**12.** සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර සමාන ලක්ෂණ පිළිබද විග්‍රහ කරන ලද ආකෘතිය වන්නේ,

(1) ෂැනොන් විවර් ආකෘතිය
(2) ශ්‍රාම් ඔස්ගුඩ් ආකෘතිය
(3) ඇරිස්ටෝටල් ආකෘතිය
(4) ඩේවිඩ් කේ. බර්ලෝ ආකෘතිය
(5) හැරල් ඩී. ලැස්වෙල් ආකෘතිය

**13.** සන්නිවේදනයෙහි කාර්යන් පිළිබද **නොගැලපෙන** යෙදුමක් සහිත කාණ්ඩය වන්නේ,

(1) තොරතුරු සම්පාදනය, සමාජානුයෝජනය, සංස්කෘතික ප්‍රවර්ධනය
(2) විනොදාස්වාද සම්පාදනය, පෙළඹවිම, සංවාද හා සාකච්ජා
(3) සමාජානුයෝජනය, තොරතුරු සම්පාදනය, මාධ්‍ය සාක්ෂරතාව
(4) සමාජ ඒකාබද්ධතාව, පෙළඹවිම, විනොදාස්වාද සම්පාදනය
(5) විනොදාස්වාද සම්පාදනය, සමාජානුයෝජනය, පෙළඹවිම

**14.** ප්‍රමාද වූ ප්‍රතිපෝෂණය (Delayed Feedback ) යන්න වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය
(2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
(3) ජන සන්නිවේදනය
(4) සමූහ සන්නිවේදනය
(5) නිර්වාචික සන්නිවේදනය

**15.** සන්නිවේදනය අඛණ්ඩ ක්‍රියාවලියක් බව පැහැදිලි කරනු ලැබුවේ,

(1) විල්බර් ශ්‍රාම් (2) හැරල්ඩ් ඩී. ලැස්වෙල් (3) ඩේවිඩ් කේ. බර්ලෝ
(4 )ෂැනන් හා විවර් (5) එඩ්වඩ් සැපීර්

**16.** එක් අන්තයක සිට දුරකථන රැහැනක් දිගේ එන පණිවිඩය අනෙක් අන්තයේදී නැවත හඬ බවට පරිවර්තනය වීම හඳුනාගත යුත්තේ කුමක් ලෙසින්ද?

(1) සම්ප්‍රේෂණය (2) සංජානනය (3) කේතකරණය
(4) ආකේතකරණය (5) විකේතකරණය

**17. ජොන් මිල්ටන්, ජොන් ලොක්, තෝමස් ජෙෆර්සන්, ස්ටුවඩ් මිල්** යන අයගේ අදහස් පිළිබඳ සාකච්ඡා කෙරෙන්නේ,

(1) අධිපතිවාදී සන්නිවේදන සංකල්පය තුළ ය.
(2) සෝවියට් කොමියුනිට්ස් සන්නිවේදන සංකල්පය තුළ ය.
(3) සමාජ වගකීම් පිළිබඳ සන්නිවේදන සංකල්පය තුළ ය.
(4) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය තුළ ය.
(5) විප්ලවවාදී සන්නිවේදන සංකල්පය තුළ ය.

**18.** පහත ප්‍රකාශ වලින් පුද්ගලාන්තර සන්නිවේදනයට **නොගැලපෙන** ප්‍රකාශය කුමක්ද?

(1) පුද්ගලයන් දෙදෙකු අතර පවතින සන්නිවේදන ක්‍රියාවලියකි.
(2) ඇතැම් විටක තාක්‍ෂණික උපකරණ ද සහය කර ගනී.
(3) සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ඍජු සබඳතාවක් පවතියි.
(4) ප්‍රතිචාර හා ප්‍රතිපෝෂණ පමා වූ ස්වභාවයක් පෙන්වයි.
(5) විද්‍යුත් තැපැලද මේ සඳහා භාවිතා කළ හැකිය.

**19.** ජන සන්නිවේදනය පිළිබඳ සාවද්‍ය අර්ථකථනය වන්නේ,

(1) තොරතුරු සම්ප්‍රේෂණය හා ලබාගැනීමේ ක්‍රියාවලියයි.
(2) සෑම විටම ආයතනගතව සිදුවේ.
(3) පොදුජන සන්නිවේදන හා පොදුජන තොරතුරු මාධ්‍යකි.
(4) සෑම විටම ග්‍රාහක ප්‍රතිපෝෂණ අන්තර් ක්‍රියාවකි.
(5) විවිධ ප්‍රතිග්‍රාහක සහ සම්ප්‍රේෂණ උපකරණවල අන්‍යෝන්‍ය ක්‍රියාවලියකි.

**20.** රේඛීය ආකෘතියක් තුළින් පැහැදිලි **නොවන්නේ,**

(1) සන්නිවේදන ක්‍රියාවලිය සිදුවන ආකාරය.
(2) සන්නිවේදනයේ ඇති රේඛීය ස්වභාවය.
(3) ප්‍රතිපෝෂණයේ ඇති වැදගත්කම.
(4) ඒක මාර්ගික සන්නිවේදනය පිළිබඳව.
(5) සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා දක්වා සන්දේශ ගමන් කිරීම.

**21.** අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය සම්බන්ධයෙන් **නොගැලපෙන** ප්‍රකාශය වන්නේ,

(1) පංචේන්ද්‍රිය මගින් තොරතුරු රැස්කර ගනියි.
(2) පුද්ගලයාගේ ආත්ම භාෂණය යි.
(3) පුද්ගලයාගේ සිත තුළ හටගනියි.
(4) මෙය පුදුගලාන්තර සන්නිවේදනය යනුවෙන්ද හඳුන්වයි.
(5) තීරණ ගැනීම ප්‍රධාන වේ.

**22.** වේදිකා නාට්‍යකදී වඩාත් දැකගත හැක්කේ,

(1) විධිමත්, වාචික හා ශව්‍ය දෘෂ්‍ය සන්නිවේදනය යි.
(2) වාචික, අවාචික, ශව්‍ය දෘෂ්‍ය සන්නිවේදනය යි.
(3) ශ්‍රව්‍ය, වාචික, අවිධිමත් හා දෘෂ්‍ය සන්නිවේදනය යි.
(4) වාචික, අවාචික, අවිධිමත් හා ලිඛිත සන්නිවේදනය යි.
දෘෂ්‍ය, ලිඛිත, විධිමත් හා අවිධිමත් සන්නිවේදනය යි.

**23.** සන්නිවේදනය සම්බන්ධයෙන් වඩාත් **සදොස්** ප්‍රකාශය තෝරන්න.

(1) සන්නිවේදන ක්‍රියාවලියේ දී සියලු පණිවිඩ තොරතුරු සම්පාදනය කරයි.
(2) සන්නිවේදනයේ මුලික අරමුණ බලපෑමක් ඇති කිරීමයි.
(3) ග්‍රාහකයෙකු නොමැතිව සන්නිවේදනය සිදු නොවේ.
(4) සන්නිවේදන ක්‍රියාවලියේදී සන්නිවේදක හා ග්‍රාහක භූමිකා ස්ථාවරව පවතී.
(5) සන්නිවේදනය සංකේත හුවමාරු ක්‍රියාවලියකි.

**24.** තොරතුරු හුවමාරු ක්‍රියාවලියට වාරණයෙන් බාධා පැමිණිය හැකිය. එසේ වීමට අවම ඉඩක් ඇති මාධ්‍ය යුගලය වන්නේ,

(1) පුවත්පත හා සගරා මාධ්‍යයි.
(2) රූපවාහිනී හා ගුවන්විදුලි මාධ්‍යයි.
(3) සිනමාව හා රූපවාහිනී මාධ්‍යයි.
(4) රූපවාහිනී හා අන්තර්ජාල මාධ්‍යයි.
(5) අන්තර්ජාලහා ජංගම දුරකථන මාධ්‍යයි.

**25.** සන්නිවේදකයා හා ග්‍රාහකයා අතර ලයිට් හවුස් උපක්‍රමය බහුලව භාවිතා වන්නේ,

(1) අන්තර් පුද්ගල සන්නිවේදනය.
(2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
(3) ජන සන්නිවේදනය.
(4) සමුහ සන්නිවේදනය .
(5) අන්තර්වර්තී සන්නිවේදනය.

**26.** තොරතුරු ගැබ් වූ සංඥවක් හේතුකරගෙන පුද්ගලයන් දෙදෙනෙකු අතර සමාන මනෝ වෘත්තීන් ඇති කිරීම සන්නිවේදනය යි යනුවෙන් ප්‍රකාශ කරනු ලැබුවේ.

(1) විල්බර් ශ්‍රාම්
(2) හැරල්ඩ් ඩී. ලැස්වෙල්
(3) ඩේවිඩ් කේ. බර්ලෝ
(4) ෂැනන් හා විවර්
(5) එඩ්වඩ් සැපීර්

**27.** සන්නිවේදනය සඳහා අත්‍යාවශම සාධකය වන්නේ,

(1) යම් සිදුවීමක් පැවතීමයි.
(2) සංඥ පද්ධතියක් පැවතීමයි.
(3) තොරතුරු පැවතීමයි.
(4) ප්‍රකාශ කිරීමට අදහස් පැවතීමයි.
(5) දෙදෙනෙකු සිටීමයි.

**28.** ජනමාධ්‍යකරුවන් දේශපාලන ක්‍රියාකරුවන් විය යුතුය. යන බව අවධාරණය කරනු ලැබුවේ,

(1) අධිපතිවාදී සංකල්පයේ දී ය
(2) නිදහස් මතවාදී සංකල්පයේ දී ය
(3) සෝවියට් කොමියුනිට්ස් සංකල්පයේ දී ය
(4) සංවර්ධන සංකල්පයේ දී ය
(5) සමාජ වගකීම් සංකල්පයේ දී ය

**29.** ලිඛිත සන්නිවේදනය සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) ලේඛනයේ නියැලීමට නිපුණතාව අවශ්‍යය යි. (2) ලේඛනය කුමක් වුවත් ආකෘතිය වෙනස් නොවේ. (3) තාක්ෂණික ක්‍රමවේද යොදාගත හැකිය. (4) භාෂාව යොදාගෙන ලිවීමයි.
(5) ලේඛනය සඳහා පදනම කියවීමයි.

**30.** මාධ්‍ය ව්‍යාප්තිය ප්‍රභල අන්දමින් සිදුවුවත් **අවම වාරණයක්** සහිත මාධ්‍ය වන්නේ,

(1) ෆේස් බුක් හා ගුවන්විදුලිය (2) රූපවාහිනිය හා ගුවන්විදුලිය
(3) සිනමාව හා රූපවාහිනිය (4) ෆේස් බුක් හා යු ටියුබ්
(5) යු ටියුබ් හා පුවත්පත්

**31.** අන්තර් පුද්ගල සන්නිවේදනය ගැන මිතුරන් සිව්දෙනෙක් දැක්වූ අදහස් පහත දැක්වෙයි.

**අමාලි - ප්‍රතිපෝෂණ ප්‍රතික්‍රියා ඉතා වේගවත්ය.**
**කමල් - නිර්වාචික සන්නිවේදනය ප්‍රභලව භාවිතා වේ.**
**තුසිත - අක්ෂි සබඳතා ක්‍රියාත්මක වෙයි.**
**නෙත්මි - අවශය නම් තාක්ෂණික උපකරණ භාවිතා කළ නොහැක.**

මේ අතුරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) අමාලි, කමල්, නෙත්මි (2) කමල්, නෙත්මි, තුසිත (3) තුසිත, අමාලි, කමල්
(4) නෙත්මි, අමාලි, තුසිත (5) සිව්දෙනාම නිවැරදිය.

**32.** ඊසොප්ගේ නිර්මාණ අයත් වන්නේ,

(1) ජන කතා (2) කතාන්දර (3) පුරාණෝක්ති
(4) උපමා කතා (5) උපදේශාත්මක කතා **33.** සන්නිවේදනයේ ස්වභාවය පිළිබඳ **නිදොස්** ප්‍රකාශය වන්නේ,

(1) ඒක මාර්ගිකව පමණක් සිදුවෙයි.
(2) සන්නිවේදනය ස්වභාවික ක්‍රියාවලියක් නොවේ.
(3) මානවයා පමණක් සන්නිවේදනයේ යෙදෙන අතර සතුන් සන්නිවේදනයේ නොයෙදේ.
(4) සන්නිවේදනයේදී සන්නිවේදකයා හා ග්‍රාහකයා අත්‍යාවශ්‍යම පාර්ශවයන්ය.
(5) සන්නිවේදන රටාවන් අවස්ථානුකූල හා පුද්ගල බද්ධ නොවේ.

**34.** ශාන්ත පෙර දිනයේදී රූපවාහිනායෙන් නරඹන ලද කාටූන් වැඩසටහන පිළිබඳ පාසලට පැමිණ සිය මිතුරු කැළට ප්‍රකාශ කරන ලදී. මෙහි දක්නට ලැබෙන සන්නිවේදන වර්ගය වන්නේ,

(1) සමූහ සන්නිවේදනය (2) අන්තර්වර්ති සන්නිවේදනය
(3) විශෝධන කණ්ඩායම් (4) පුද්ගලාන්තර සන්නිවේදනය
(5) වාචික සන්නිවේදනය

- අංක **35** සිට **38** දක්වා පහත ඇති අංග ඇසුරින් පිළිතුරු සපයන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| A | අග්‍රස්ථානය | B | බලපෑම | C | බාධක |
| D | මූලාශ්‍රය/සන්නිවේදක | E | ප්‍රතිපෝෂණය | F | සන්දර්භය |
| G | ට්‍රාන්ස්මිටරය/සම්ප්‍රේෂකය | H | පණිවිඩය | I | නාලිකාව |
| J | අත්දැකීම් පසුතලය | K | ග්‍රාහකයා | L | සංඥා |

**35.** ඉහත දක්වා ඇති අංග අතුරෙන් ෂැනන් හා වීවර්ගේ සන්නිවේදනය පිළිබඳ **ආකෘතියට** අයත් නොවන අංග තුනක් වන්නේ,

(1) A, B හා L (2) B, F හා J (3) C, I හා K
(4) E, C හා J (5) G, H හා D

**36.** ඉහත අංග අතුරින් හැරල් ඩී. ලැස්වෙල්ගේ **නිර්වචනයට** අනුරූප අංග වන්නේ,

(1) D, H, I, K හා B (2) J, D, F,B හා K (3) L, G, H, C හා A
(4) L, I, H, G හා C (5) K, G, C, A හා E

**37.** මෙකී අංග අතුරෙන් K සිට D දක්වා H ගමන් කළේ ය යි සිතන්න. මෙය හැඳින්විය යුතු වන්නේ,

(1) A ලෙස ය. (2) B ලෙස ය. K (3) C ලෙස ය.
(4) E ලෙස ය. (5) L ලෙස ය.

**38.** ඉහත සංකේත ඇසුරෙන් ඩේවිඩ් කේ. බර්ලෝගේ ආකෘතිය ඉදිරිපත් කළේ නම්, එය වඩාත් සමීප වන්නේ පහත සඳහන් කිනම් වරණයටද?

(1) A → H → B → E

(2) D → C → H → K

(3) D → H → I → K

(4) G → H → J → G

(5) L → G → H → A

**39.** සිසුන් පස් දෙනෙක් දැක් වූ අදහස් වලට අනුව ජනමාධ්‍ය පණිවිඩය.

A යන්ත්‍ර සූත්‍ර ආධාරයෙන් පමණක් නිපදවෙයි.
B රහස්‍ය භාවයෙන් තොරවේ.
C සමජාතිය ග්‍රාහක පිරිසක් වෙත යොමුවෙයි.
D සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.
E බොහෝ විට ලාභය අරමුණු කරගනී යි.

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) A, B, C හා D පමණක් සත්‍ය වේ. (2) A, B, D හා E පමණක් සත්‍ය වේ.
(3) A, C, D හා E පමණක් සත්‍ය වේ. (4) B, C, D හා E පමණක් සත්‍ය වේ.
(5) A, B, C , D හා E යන සියල්ල සත්‍ය වේ.

**40.** ජනසන්නිවේදන ක්‍රියාවලිය ඉතා හොඳින් විමර්ෂණය කරන විට පහත සඳහන් තොරතුරු වාර්තා වී තිබුණි.

A පොදු පණිවිඩ පමණක් බෙදාහරියි.
B තාක්ෂණික මෙවලම් භාවිතය අනිවාර්ය තත්වයක් නොවේ.
C සෑම විටම සංඛ්‍යාත්මක අගයක් නිශ්චිත නො වූ විසිරී පැතිරී සිටින ග්‍රාහක පිරිසක් ඉලක්ක කර ගනි.
D සන්නිවේදකස්ථානය තුළ විධිමත් හා සංවිධානාත්මක බවක් නැත.
E දොරටුපාලකයන් සිටිම අනිවාර්ය ලක්ෂණයකි.

ඉහත තොරතුරු අතුරින්,

(1) A, B හා C සත්‍ය වන අතර D හා E අසත්‍ය වේ.
(2) A, C හා E සත්‍ය වන අතර B හා D අසත්‍ය වේ.
(3) B, C හා E සත්‍ය වන අතර A හා D අසත්‍ය වේ.
(4) B, D හා E සත්‍ය වන අතර A හා C අසත්‍ය වේ.
(5) C, D හා E සත්‍ය වන අතර A හා B අසත්‍ය වේ.

**41.** සංඥා, සංකේත. ශබ්ද මගින් අදහස් හුවමාරු කරගත් මානවයාට වඩාත් පුළුල් ලෙස අදහස් හුවමාරු කර ගැනීමට හැකියව ලැබෙන්නේ

(1) දුරකථනය නිසාවෙනි. (2) අක්ෂර මාලාව හොයාගත් නිසාවෙනි.
(3) භාෂාව බිහිවීම නිසාවෙනි. (4) සන්නිවේදන විෂය නිසාවෙනි. (
5) නොඳියුනු කටහඬ නිසාවෙනි.

**42.** ජනමාධ්‍ය බිහිවීමේදි ප්‍රථමයෙන් බිහි වූ මාධ්‍ය වන්නේ,

(1)ගුවන්විදුලිය (2) පෝස්ටරය (3) රූපවාහනිය
(4) ලෙන් චිත්‍ර (5) පුවත්පත

**43.**පහත සඳහන් ප්‍රකාශ නියෝජනය කරනු ලබන සන්නිවේදන සංකල්පය වන්නේ,

A ජනමාධ්‍යවේදීන්ගේ කාර්යභාර්ය වන්නේ පාලන යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වය ගැටළු වලින් තොරව පවත්වාගෙන යාමට ජනතා කැමැත්ත දිනා දීමයි.
B ජනමාධ්‍යවේදීන් සිය කාර්ය නිසිලෙස ඉටු නොකරන විට එය නිවැරදි කිරීමට රජයට මැදිහත්විය හැකිය.
C නියෝග හා විධාන මගින් පාලන තන්ත්‍රයට අවැසි ලෙස ජනමාධ්‍ය මෙහෙයවිය හැකිය.

නිවැරදි පිළිවල වන්නේ

(1) (A) සමාජ වගකීම් (B) සෝවියට් කොමියුනිට්ස් (C) නිදහස් මතවාදී
(2) (A) සෝවියට් කොමියුනිට්ස් (B) සමාජ වගකීම් (C) අධිපතිවාදී
(3) (A) අධිපතිවාදී (B) සෝවියට් කොමියුනිට්ස් (C) නිදහස් මතවාදී
(4) (A) නිදහස් මතවාදී (B) සමාජ වගකීම් (C) සෝවියට් කොමියුනිට්ස්
(5) (A) සෝවියට් කොමියුනිට්ස් (B) නිදහස් මතවාදී (C) අධිපතිවාදී

**44.** නිවසතට ඇතුළුවිමට උත්සාහ කළ සොරෙකු බල්ලෙකු බිරීම නිසා ගෙහිමියාට පැහැදිලිව දැක ගැනීමට හැකිවිය, සොරා හඳුනා ගැනීමට ගෙහිමියාට ඉවහල් වූ සන්නිවේදන විධික්‍රම නැතහොත් සන්නිවේදන ස්වරූපයන්ගේ අනුපිළිවල වන්නේ,

(1) ශ්‍රව්‍ය හා අවිධිමත් සන්නිවේදනය. (2) වාචික හා නිර්වාචික සන්නිවේදනය.
(3) ශ්‍රව්‍ය හා දෘෂ්‍ය සන්නිවේදනය. (4) අවිධිමත් හා අන්තර්වර්තී සන්නිවේදනය.
(5) දෘෂ්‍ය හා ශ්‍රව්‍ය සන්නිවේදනය.

**45.** අන්දරේට රජවාසල මිදුලේ වනාතිබූ සිනී කැමට සිතුනේය. ඔහු නිවසට ගොස් තම පුතුට කතාකොට මව මිය ගිය බව රජ වාසලට පැමිණ තමාට දන්වන ලෙස කිවේය. මෙහි දක්නට ලැබෙන සන්නිවේදන වර්ග අනුපිළිවල වන්නේ,

(1) පුද්ගලාන්තර හා සමූහ සන්නිවේදනය. (2) අන්තර්වර්ති හා සමූහ සන්නිවේදනය.
(3) වාචික සන්නිවේදනය හා පුද්ගලාන්තර සන්නිවේදනය. (4) අන්තර්වර්ති හා පුද්ගලාන්තර සන්නිවේදනය.
(5) පුද්ගලාන්තර හා අන්තර්වර්ති සන්නිවේදනය.

**46.** එළිමහන් වේදිකාවක ගීත කිහිපයක් ගායනා කර නික්ම යන ගායකයෙකුට ප්‍රේක්ෂකයන් one more, one more යනුවෙන් ඔල්වරසන් දුන්නනේය. මෙම ප්‍රතිචාරය හඳුන්වන්නේ

(1) සක්‍රීය ප්‍රතිපෝෂණය
(2) නිෂේධනාත්මක ප්‍රතිපෝෂණය
(3) ක්ෂණික ප්‍රතිපෝෂණය
(4) ප්‍රමාදී ප්‍රතිපෝෂණය
(5) අක්‍රීය ප්‍රතිපෝෂණය

**47.** මෙහි දැක්වෙන්නේ අවිධිමත් සන්නිවේදන දාමයකි එය හඳුන්වනු ලබන්නේ,




(1) තනි දාමයකි
(2) ඕපාදූප දාමයකි
(3) සම්භාවිතා දාමයකි
(4) පර්ෂද දාමයකි
(5) අලිබිත දාමයකි

- ප්‍රශ්ණ අංක 48, 49 සහ 50 සඳහා පහත ආකෘතිය භාවිතා කරමින් පිළිතුරු සපයන්න.




**48.** ඉහත ආකෘතියේ A යනුවෙන් හඳුන්වන්නේ,

(1) මූලාශ්‍රය
(2) සන්නිවේදකයා
(3) ග්‍රාහකයා
(4) තොරතුරු මූලය
(5) සංඥ

**49.** මෙහි E ස්ථානය නියොජනය කරන්නේ

(1) ආකේතකරණය
(2) මූලාශ්‍රය
(3) විකේතකරණය
(4) තොරතුරු මූලය
(5) සංඥ

**50.** මෙහි ඝෝෂණ මූලය යනු

(1) ශබ්ද මූලය
(2) ට්‍රාන්ස්මිටරය
(3) බැටරිය
(4) තරංග
(5) ආකේතකරණය